# මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU)

## පුරප්පාඩු

**01. <u>ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය:</u>**

කොළඹ වරාය නගරය වූ කලී ශ්‍රී ලංකාවේ මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්කය වන කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි ආකර්ෂණීය වානිජ නගරය වන කොළඹ නගරය දීර්ඝ කිරීමෙන් අනතුරුව ගොඩ නගා සංවර්ධනය කරන ලද නවතම නගරයකි. ගොඩබිම සිට සමුද්‍රය දෙසට හෙක්ටෙයාර 269ක් දක්වා දිවෙන බිම් තීරයේ පිහිටි මෙම කොළඹ වරාය නගරය ඉන්දීය සාගරයේ උණුසුම් දිය දහර ආසන්නයේ අසමසම සැලසුම්ගත නාගරික ජීවන රටාවක පහසුකම සලසා දෙමින් දකුණු ආසියාවේ ප්‍රමුඛ නේවාසික, සිල්ලර සහ ව්‍යාපාරික ගමනාන්තයක් වනු ඇත. මෙම වරාය නගරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙත පැවරී ඇති වගකීම් සම්බන්ධීකරණය, කළමනාකරණය, නිරීක්ෂණය සහ සුපරීක්ෂණය සඳහා අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපනය කර ඇත.

**02. <u>පුරප්පාඩු තනතුරු:</u>**

| අ/අං | තනතුර | චක්‍රලේඛ අංක 02/2026 අනුව වැටුප් කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | සිවිල් ඉංජිනේරු (ව්‍යුහ) | කාණ්ඩය - ඇ<br>ඉංජිනේරු (I)<br>ඉංජිනේරු (II)<br>ඉංජිනේරු (III) | 01 |
| 02. | සිවිල් ඉංජිනේරු (යටිතල පහසුකම්) | | 01 |

03. 2026.03.28 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2026 අනුව ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම් කිරීමට අයදුම්කරුවන් යටත් පිරිසෙයින් පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

| අංකය | තනතුර/තනතුරු | වැටුප් කාණ්ඩය | සුදුසුකම් |
|---|---|---|---|
| **01** | **සිවිල් ඉංජිනේරු (ව්‍යූහ)**<br>**සහ**<br>**සිවිල් ඉංජිනේරු (යටිතල පහසුකම්)** | **කාණ්ඩය - ඇ**<br>**ඉංජිනේරු (I)** | (පහත සඳහන් 1 හෝ 2)<br>1. අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය / අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්,<br>**සහ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදීන්ගේ ආයතනයක අනුබද්ධ සමාජිකත්වය / ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්,<br>**ඒ සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද.<br>2. අදාළ ක්ෂේත්‍රයේ රජයේ දීප ව්‍යාප්ත සේවාවක II / III වන පංතියේ හෝ ඉන් ඉහළ පංතියක නිලධාරියෙක් වීම හෝ ඒ හා සමාන සුදුසුකමක්<br>**සහ**<br>අදාළ ක්ෂේත්‍රයේ II / III වන පංතියේ තනතුරක අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද හෝ ඒ හා සමාන සුදුසුකමක් |
| | | **කාණ්ඩය - ඇ**<br>**ඉංජිනේරු (II)** | (පහත සඳහන් 1 හෝ 2)<br>1. අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය / අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්,<br>**සහ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදීන්ගේ ආයතනයක අනුබද්ධ සමාජිකත්වය / ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්,<br>**ඒ සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.<br>2. අදාළ ක්ෂේත්‍රයේ රජයේ දීප ව්‍යාප්ත සේවාවක II / III වන පංතියේ හෝ ඉන් ඉහළ පංතියක නිලධාරියෙක් වීම හෝ ඒ හා සමාන සුදුසුකමක්<br>**සහ**<br>අදාළ ක්ෂේත්‍රයේ II / III වන පංතියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද හෝ ඒ හා සමාන සුදුසුකමක්. |

| | | | |
|---|---|---|---|
| | | **කාණ්ඩය - ඇ**<br><br>**ඉංජිනේරු (III)** | (පහත 1)<br><br>1. අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය / අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්.<br>**සහ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදීන්ගේ ආයතනයක අනුබද්ධ සමාජිකත්වය / ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්, |

**04.** **පොදු කොන්දේසි: -**

අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

**05.** වැටුප් **: -**

2026.03.28 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2026 සහ අදාළ අනෙකුත් කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව වැටුප් ගෙවනු ලබන අතර එම අදාළ චක්‍රලේඛ අනුව දීමනා සහ ප්‍රතිලාභ හිමි වේ.

**06.** **අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා වන කොන්දේසි: -**

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2:3:3 ඡේදයේ (ආ) වගන්තිය ප්‍රකාරව අයදුම් කළ යුතු අතර, රාජ්‍ය සේවයේ නොමැති අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය අදාළ ආයතනයේ ප්‍රධානියා මගින් යොමු කළ යුතු ය.

**07.** **අයදුම්පත්: -**

රාජ්‍ය / රාජ්‍ය නොවන ආයතනවල අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත අදාළ ආයතනයේ ප්‍රධානියා මගින් යොමු කළ යුතු අතර, සෘජුව ම යොමු කරනු ලබන අයදුම්පත් සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු සමග 2026.05.26 **දින හෝ එයට පෙර** පහත සඳහන් ඊ-මේල් ලිපිනයට එවිය යුතු ය.

ඊ-මේල් ලිපිනය: **psportcity@gmail.com**